# 13. සාමයේ රජු පිළිගනිමු


ජේසුස් වහන්සේ මිනිසුන් අතර යහපත් සේවයක යෙදුණා. ඒ නිසා උන්වහන්සේට ``සාමයේ රජු'' යයි කියනවා. ජේසුස් වහන්සේ ලොකු කුඩා සියලු දෙනාට ම ආදරය කළා.

මිනිසුන් අතර සිටි ලෙඩුන්ට සුවය ලබා දුන්නා.

ඔවුන්ගේ උවමනා ඉටු කළා. යටහත් පහත් ලෙස මිනිසුන් අතරේ ජීවත් වුණා. වැරදි කළ අයට සමාව දුන්නා. ජේසුස් වහන්සේ සාමය ලබා දීමට ක්‍රියා කළේ මේ අන්දමටයි.

ඒ කාලයේ සිටි වෙනත් රජවරු ගමන් යෑමට හෝ සටන්වලට යෑමට යොදා ගත්තේ අශ්වයෙක්. එහෙත් සාමයේ රජ වූ ජේසුස් වහන්සේ තෝරා ගත්තේ කොටළුවෙක්.

ජේසුස් වහන්සේ කොටළුවා පිට ජෙරුසලමට ඇතුළු වන විට දෙපස සිටි ළමයි සහ මිනිස්සු ``හෝසන්නා හෝසන්නා'' කියා ප්‍රශංසා කළා. තල් අතු වනමින් ප්‍රීති ඝෝෂා කරමින් සාමයේ රජ පිළිගත්තා.



1. තල් අතු පෙරහැරකි
සුරතල් කොටළුවෙකි
ඒ පිට නැගි රජෙකි
හෝසන්නා හඬෙකි

2. මිනිසුන් පේළියකි
ගැහැනුන් පේළියකි
ළමයින් පේළියකි
ඒ මහ පෙරහැරකි

3. සළු ගෙන කරකවති
දෙපසින් අතු කඩති
මහ මග අතුරැවති
''හෝසන්නා'' කියති

4. දරුවකුගේ සිතැති
ඒ මහ රජ කෙනෙකි
සාමය ගෙන වඩිති
''සාමයෙ රජු'' කියති

## පැවරුම්

1. තල් අතු පොල් කොළ හෝ ගොක් කොළ ගෙන කුරුස සාදන්න.
2. සාමයේ රජු පිළිගැනීමේ නාට්‍ය රඟපාන්න.
3. මේ සම්බන්ධ ගීතිකා ඉගෙන ගන්න.